**ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 22 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරනය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

---

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරනය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,390,790,095 ක් වූ දේපළ පිරියත හා උපකරණවල අගය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂය ලෙස ගැනීමේදී රු.2,258,600,729 ක් ලෙස සංශෝධනය කර තිබුණි. එසේ වුවද භාණ්ඩාගාරය විසින් රු.860,224,482 ක් වූ ආරම්භක ශේෂයට සිදුකර ඇති සංශෝධනයන් සැඳුම්ලත් ආකාරය පිළිබඳව විගණනයට තහවුරුවක් නොවීය. | භාණ්ඩාගාරය විසින් සංශෝධනයන් සිදුකිරීම හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇති බව. | භාණ්ඩාගාරය විසින් සිදුකල සංශෝධනය පිළිබඳව ලේඛණගත තහවුරු කිරීම් ලබාගත යුතු වීම. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය- ඒසීඒ 6 අනුව සමාලෝචිත වර්ෂය අවසානයට කෙරීගෙන යන වැඩ වටිනාකමක් දක්වා නොමැති වුවද, මූල්‍ය නොවන වත්කම් සමුච්චිත වාර්තාව - එස්ඒ 82 හි කෙරීගෙන යන වැඩ ලෙස රු.27,162,611 ක අගයක් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ සහය ලබාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් සසඳා නිවැරදි කර ගැනීමට කටයුතු කල යුතු වීම. |

**1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෞද්ගලික පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතට ගතයුතු රු.13,770,304 ක් භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් යටතට ගෙන තිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ඒ හා සමාන ප්‍රමාණයකින් වැඩියෙන්ද ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ඒ හා සමාන ප්රමාණයකින් අඩුවෙන්ද දක්වා තිබුණි. | එම වියදම් ප්‍රාග්ධන ස්වරූපයක් ගන්නා බැවින් භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් යටතට ගෙන ඇති බව. | අදාල මුදල් ප්‍රවාහය නිවැරදිව හදුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉල්ලුම්කල අග්‍රිම වටිනාකම රු.6,554,532,905 ක් වූ අතර වර්ෂය තුල ලද අග්‍රිම වටිනාකම රු.4,807,827,877 ක් පමණක් විය. ඒ අනුව ඉල්ලුම් කල අග්‍රිම ප්‍රමාණයට වඩා අඩුවෙන් ලද අග්‍රිම වටිනාකම රු.1,746,705,028 ක් විය. | යම් මාසයක ඉල්ලුම් කර නොලැබුණු අග්‍රිම ඊළග මාසයේදී ද ඉල්ලුම් කරන බැවින් ඉල්ලුම් කල සමස්ථ අග්‍රිම ප්‍රමාණය වැඩි වී ඇති බව. | භාණ්ඩාගාරය සමග සමීප සම්බන්ධතාවයකින් යුතුව අග්‍රිම කලමනාකරණය කර ගැනීමට කටයුතු කල යුතුවීම |

**2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල ප්‍රතිපාදන මත ඉටුකළ සංවර්ධන ව්‍යාපෘතිවල සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ගෙවිය යුතු අතැති බිල්පත්වල වටිනාකම රු.12,012,042 ක් විය. මින් රු.10,650,849 ක බිල්පත් 2021 අප්‍රේල් මාසය වනවිට නිරවුල් කර නොතිබූ අතර ප්‍රතිපාදන නොලැබීම මත තවදුරටත් 2019 වර්ෂයට අදාලව නිරවුල් කල යුතු බිල්පත්වල වටිනාකම රු. 1,361,193 ක් විය. | ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් නිරවුල් කිරීමට නොහැකි වූ බව | භාණ්ඩාගාරය සමග සමීප සම්බන්ධතාවයකින් යුතුව ප්‍රතිපාදන නොපමාව ලබාගැනීමට කටයුතු කල යුතුවීම. |

**2.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර මාර්ගෝපදේශ නිකුත්කර තිබුණද විගණනය වෙත ඉදිරිපත් නොකරන ලද බවත් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත්. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.4 තැන්පත් ශේෂයන්

--------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ට අදාලව තැන්පතු ගිණුම් 4 ක 2020 දෙසැම්බර් 31 දිනට තැන්පතු ශේෂය රු.336,598,104 ක් වූ අතර ඉන් ඉඩම් තැන්පතු හැර මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු නොකරන ලද වර්ෂ 02 ට වැඩි තැන්පතු ශේෂය රු.25,305,912 ක් විය. මෙයින් වසර 5 ට වැඩි රු.16,450,481 ක තැන්පතු ශේෂයක් කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිකිරීමට අදාලව කොන්ත්‍රාත්කරු අදාල කාර්යය ඉටු නොකිරීම හේතුවෙන් මුදල් කරගත් අත්තිකාරම් බැඳුම්කරය හා ඒ දක්වා ගෙවීම්වල අතරුඳවුම් මුදල් වන අතර වර්තමානය වනවිට නව කොන්ත්‍රාත්කරුවෙකු යටතේ ඉදිකිරීම් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් විය. | අතරුඳවුම් තැන්පතු අදාල ආයතන විමසා රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කරන බවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිකිරීමට අදාල රුඳවුම් මුදල් 2021 සැප්තැම්බර් 01 දින වනවිට නිරවුල් කල හැකි බව. | තැන්පතු අදාල කාර්යයට යෙදවීමට හා මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

## 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

---------------------------------------------

| විගණන නිරීක්ෂණය<br>--------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය, ප්‍රජා පාලිත ක්‍රමවේදයක් භාවිතයෙන් පිටු දැකීම අරමුණු කරගත් ජනාධිපති ලේකම් කාර්යාලයේ තිරසර සංවර්ධන අංශය මඟින් හඳුන්වා දී තිබුණු ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ජනතා සමිති ස්ථාපිත කිරීම සඳහා 2018 සහ 2019 වර්ෂවලදී ලද ප්‍රතිපාදන මත පළමු අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 තුල ජනතා සමිති 43 ක් වෙත රු. 69,575,200 ක් ද 2019 වර්ෂයේදී දෙවන අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 තුල ජනතා සමිති 96 ක් වෙත රු.4,560,000ක් ද ලබාදී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට පළමු අදියරේදී ලබාදුන් මුදලින් සියයට 71 ක් ලෙස සමිති 34 ක රු.49,812,357 ක් ද, දෙවන අදියරේදී ලබාදුන් මුදලින් සියයට 96 ක් ලෙස සමිති 96 ක රු.4,358,021 ක් ද අදාල කාර්යය සඳහා යෙදවීමෙන් තොරව එකී සමිතිවල බැංකු ගිණුම්වල පැවතුණි. | මෙම වැඩසටහන ජනාධිපති කාර්යාලයෙන් ඉවත් කර ඇති අතර වර්තමානයේ සෞභාග්‍යා කාර්යංශය වෙත පවරා ඇති බවත් එම කාර්යංශය මගින් ග්‍රාම ශක්ති සමිතිවල ලියාපදිංචිය සමාගම් මැදුරෙන් ඉවත්කර ඉදිරි කටයුතු සිදුකරන බව | ප්‍රතිපාදන අදාල අරමුණු ගත කාර්යයට යොදාගත යුතුවීම. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීමෙ | නිර්දේශය |
|---|---|---|
| (අ) ස්මාර්ට් ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 මැයි 21 දිනැති අංක PS/SD/SMART-OP-01 දරන ලිපිය අනුව ස්මාර්ට් ශ්‍රී ලංකා වැඩ සටහන යටතේ වූ පරිගණක මෘදුකාංගය භාවිතයෙන් ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා වන රැකියා අපේක්ෂිත සේවා ලාභීන් සඳහා , ව්‍යාපාරික ආයතන , ඒවායේ රැකියා, ව්‍යවසායකත්ව අවස්ථා, තාක්ෂණික සේවා පුහුණුව, සහනදායී මිලට තාක්ෂණ උපකරණ, මූල්‍ය සේවා හා ඒවා සපයන ආයතන ආදිය පිළිබඳව තොරතුරු ඇතුලත් කර රැකියා බැංකුවක් ලෙස හා මාර්ගෝපදේශකයෙකු වශයෙන් කටයුතු කරමින් තරුණ විරැකියාව අවම කිරීම සැලසුම්කර තිබුණි. ඒ යටතේ කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලද ප්‍රතිපාදන මත ගලිගමුව, රුවන්වැල්ල, දෙහිඕවිට හා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ස්මාර්ට් ශ්‍රී ලංකා මධ්‍යස්ථාන පිහිටුවීමට රු.1,744,015 ක් ද හඳුන්වාදීමේ හා පුහුණු වැඩසටහන් සඳහා රු.241,278 ක් ද ලෙස රු.1,985,293 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට වැයකර තිබුණි. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෘදුකාංග සහිත පරිගණක 22 ක් ද ලබාදී තිබුණි. එහෙත් විගණන අවස්ථාව වූ 2021 මාර්තු වනවිටත් ස්මාර්ට් ශ්‍රී ලංකා වැඩසටහනේ අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරී තත්වයක නොපැවතුණි. | මෙම වැඩසටහන වර්තමානය වනවිට මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවට පවරා ඇති බව හා ඒ යටතේ ඉටුකිරීමට සැලසුම් කර ඇති බව . | අදාල ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණුගත කාර්යයන් සඳහා යොදාගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නායයෑමෙන් හා නායයෑම් අවදානම් තත්වයන් හේතුවෙන් විපතට පත් පවුල් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂයේදී රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල පවුල් 78 ක් හදුනාගෙන තිබුණි. එයින් පවුල් 28 ක් විවිධ හේතු මත ප්‍රතිලාභ ලබාදීම් සඳහා ඇතුලත්ව නොතිබූ අතර ඉතිරි පවුල් 50 අතරින් පවුල් 15 ක් විසින් තම නිවාස ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වනවිටද සම්පූර්ණ නොකිරීම හේතුවෙන් නොගෙවා පවතින නිවාස ආධාර ප්‍රමාණය රු.4,850,000 ක් විය. එමෙන්ම මොරලිය වත්ත ප්‍රදේශයේ පිහිටි මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා ජල සැපයුම් පද්ධතියක් ඉදිකර පැවතියද ජල සැපයුම් ලබාදීම විගණන අවස්ථාව වූ 2021 පෙබරවාරි වනවිටත් සිදුකර නොතිබුණි. | ඇතැම් නිවාස ලාභීන් විසින් රජය විසින් දුන් නිර්නායක වලට අනුකූල වන ලෙස නිවාස ඉදිකිරීම් කර නොතිබීම නිසා වාරික ගෙවීම අත්හිටුවා ඇති බව. | පවතින ගැටළු නිරාකරණය කර නිවාස ආධාර ගෙවීමට කටයුතු කලයුතු වීම. |
| (ඇ) | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයෙන් 2018 වර්ෂයේ ලද රු.1,500,000 ප්‍රතිපාදන මත යටියන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් තැලිගම ග්‍රාම නිලධාරී වසමේ ඉංගිරියාවත්ත ප්‍රදේශයේ කාන්තා නිෂ්පාදන අලෙවි කිරීමේ වෙළඳ කුටි හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු (වැසිකිළි 2) 2018 වර්ෂය අවසන් වනවිට නිමකර තිබුණි. එහෙත් විගණන ක්ෂේත්‍ර පරීක්ෂණ දිනය වූ 2021 අප්‍රේල් 21 දින වනවිටත් අදාල ඉදිකිරීම් අරමුණු ගත කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණි. | නැවත වෙළඳ කුටි උපයෝජනය කිරීමට කටයුතු කරන බව. | ව්‍යාපෘති නිමවූ විගස අරමුණු ගත කාර්යයන් සඳහා යොදාගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගම්පෙරළිය කඩිනම් සංවර්ධන වැඩසටහන -2019 යටතේ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් පනාවත්ත නො.01 ජල ව්‍යාපෘතිය සඳහා රු.970,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. අදාල ව්‍යාපෘතියට අයත් ළිදේ කැණීම් කටයුතු සිදුකිරීමේදී ගලක් මතු වීම හේතුවෙන් තවදුරටත් කැණීම් කටයුතු සිදු කර නොතිබූ අතර ඉටුකල වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.101,920 ක් ගෙවීම් කර තිබුණි. විගණන ක්ෂේත්‍ර පරීක්ෂණ දිනය වූ 2021 අප්‍රේල් 21 දින වනවිටත් අදාල පරිශ්‍රය ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස වල් බිහිවී පැවති අතර ව්‍යාපෘතියේ අරමුණ වූ ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලබාදීමද ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | ජනතාවට ප්‍රයෝජන ගත හැකි ව්‍යාපෘතියක් ලෙස සකසා දෙන ලෙස ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත දැනුම් දී ඇති බව. | අප්‍රමාදව වෙනත් විකල්ප ක්‍රියා මාර්ග ගැනීම තුලින් අදාල අරමුණ ඉටුකිරීමට කටයුතු කල යුතුය. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | නායයෑමෙන් අවතැන්වූවන් නැවත පදිංචි කිරීම සඳහා අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හබලක්කාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රූඩ් 3 පර්චස් 12 ක් වූ කොබේකඩුවහේන නැමැති ඉඩම පවරා ගැනීමේ කටයුතු 2016 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ඉඩම් පවරා ගැනීමේ කටයුතු හා ඉඩම් හිමියන්ට වන්දි ගෙවීමේ කටයුතු අවසන්ව නොතිබුණි. | අනෙකුත් සම්බන්ධීකරණ ආයතනවල ප්‍රමාදය හා ඉඩම් හිමියන්ට වන්දි ගෙවීම සඳහා ඉඩම් අමාත්‍යාංශයෙන් මේ දක්වා ප්‍රතිපාදන ලැබී නොමැති බව. | අදාල ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් කටයුතු කල යුතු වීම. |
| (ආ) | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලද රු.17,339,861 ක ප්‍රතිපාදන මත 2018 වර්ෂයේදී ආරම්භ කර තිබුණු කෑගල්ල නිල්වක්ක ඝන මීටර් 80 ක ධාරිතාවයකින් යුතු ෆෙරෝ සිමෙන්ති ජල ස්ථම්භය සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ජල සැපයුම ලබාදී නොතිබුණි | ජල ටැංකියේ කටයුතු අවසන්ව ඇති බව හා අප්‍රමාදව ජල සැපයුම ලබාදීමට කටයුතු කරන බව | ව්‍යාපෘතිය අප්‍රමාදව අරමුණුගත කාර්යයන් සඳහා යොදාගත යුතු වීම |

| | | | |
|---|---|---|---|
| (ඇ)) | මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අවතැන්වූ පවුල් 88 ක් වෙනුවෙන් ඉඩම් ලබාදීම සඳහා වැවිලි සමාගමට අයත් අඹදෙණිය වත්තේ අඹදෙණිය කොටසින් අක්කර 25 ක් අත්පත් කර ගැනීමේ කටයුතු 2016 වර්ෂයේදී ආරම්භ කර පැවතුණි. එහෙත් මූලික පිඹුර සකස් කිරීමේ, තත්ත්ව වාර්තා ලබාගැනීමේ ප්‍රමාදයන් හා ඉඩම් අයිතිය පිළිබද ගැටළු හේතුවෙන් ඉඩම් පවරාගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අවසන්ව නොතිබුණි. | අනෙකුත් සම්බන්ධිත ආයතනවල ප්‍රමාදයන් හේතුවෙන් අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රමාදවූ බව. | අදාල ආයතන සමග සම්බන්ධීකරණය කිරීමෙන් පවරා ගැනීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව කල යුතු වීම. |

## 3.4 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගම්පෙරලිය වැඩසටහන යටතේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් වෙත ලද ප්‍රතිපාදන මත කෑගල්ල ප්‍රාදේශීය සභාව විසින් රු.970,000 ක පිරිවැයකට 2019 වර්ෂය වනවිට වැඩ නිමකර තිබූ හෙට්ටිමුල්ල රජමාවත සංවර්ධනයට අදාලව ඉදිකිරීම් කටයුතු කොටස් 03 කට සිදුකර තිබුණි. මෙම මාර්ගය භෞතික පරීක්ෂාවේදී කොන්ක්‍රීට් තට්ටුව මතුපිටෙහි ඇති ගල් ගැලවෙමින් පැවති අතර මාර්ගයේ මතුපිට කුඩා වලවල් පැවතුණි. ඒ හේතුවෙන් මෙම මාර්ගය ඉදිකිරීමේදී යොදාගත් මිශ්‍රණයන්හි ප්‍රමිතිය ගැටළුකාරී විය. | කොන්ත්‍රාත්කාර ගොවි සංවිධානය විසින් අඩුපාඩු සකසා පිලිසකර කරන බව හා පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් විමර්ශනයක් සිදුකරන බව ප්‍රාදේශීය සභාව විසින් දන්වා ඇති බව. | ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදුකල යුතු වීම. |

## 3.5 නොවිසඳී ඇති විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව ඉකුත් වර්ෂවල විගණකාධිපති වාර්තාවල ඇතුලත් කර තිබූ පසුවිපරම් කටයුතු නිම නොවූ ඡේද පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහල් දෙකකින් සමන්විත තුත්තිරිපිටිය බස්නැවතුම්පල රු.23,570,905 ක ඇස්තමේන්තුවකට ඉදිකිරීමට 2014 පෙබරවාරි 19 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට භාරදී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.3,988,900 ක වියදමක් කර ඉදිකිරීම් කටයුතු අතරමග නවතා තිබුණි. මෙම ඉඩම රජයට අයත් ඉඩමක් බැවින් අරණායක ප්‍රාදේශීය සභාවට පවරා දීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා 2018 හා 2019 වර්ෂයන්හි පළාත් ඉඩම් කොමසාරිස් වෙත දන්වා යවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම කාර්යය ඉටුවී නොතිබුණි. | කොන්ත්‍රාත්කාර ආයතනය වූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිකිරීම් අතරමග නතර කර ඇති බව හා අරණායක ප්‍රාදේශීය සභාවේ ඉල්ලීම මත මෙම ඉඩම වෙනත් කාර්යයක් සඳහා යොදවා ගැනීමට පළාත් ඉඩම් කොමසාරිස්ගෙන් අනුමැතිය ඉල්ලා ඇති බව | ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී වැයකරන මුදලට ප්‍රතිලාභයක් ලැබෙන පරිදි සැලසුම්කල යුතු වීම |
| (ආ) | ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීම හා පුනරුත්තාපන පළාත් සංවර්ධන යෞවන කටයුතු අමාත්‍යාංශයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත කිතුල්ගල නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2019 වර්ෂයේදී රු.35,615,876 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. ඒ යටතේ කිලෝමීටර් 0.8 ක දිගකින් යුත් කිතුල්ගල නගර මධ්‍යයේ මාර්ගය දෙපස පුළුල් කොට පැති කාණු ඉදිකිරීමට රු.25,698,900 ක මුදලකට ගිවිසුම්ගතව තිබුණි. මෙම කර්මාන්තය ඉටුකරගෙන යාමේදි බාහිර පාර්ශවයකින් එල්ලවූ බලපෑමක් මත 2019 නොවැම්බර් 29 දින සිට ඉදිකිරීම් කටයුතු අතරමග නතර කර තිබුණි. | පළාත්ආණ්ඩුකාරතුමා සමග සාකච්ඡා කර නව ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කිරීමේ හැකියාව පිළිබඳ කටයුතු සිදුකරන බව. | නව ව්‍යාපෘති සැලසුම් කිරීමේදී වැයකල මුදලට ප්‍රතිලාභයක් ලැබෙන පරිදි සැලසුම් කල යුතු වීම |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටුකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 ප්‍රකාරව සියලුම රාජ්‍ය ආයතන විසින් තම ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය හඳුන්වා දිය යුතු වුවත්, උක්ත චක්‍රලේඛය නිකුත් කළ දින සිට වසර 12 කට අධික කාලයක් ගත වී ඇතත් කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක පුරවැසි ප්‍රඥප්තිය පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රඥප්ති පිළියෙල කර නොමැති ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පිළියෙල කර ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම ප්‍රඥප්ති පිළියෙල කල යුතුවීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරීවරයෙකු 2020 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුල උතුරු මැද පළාත් සභාවේ පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කර තිබුණි. එහෙත් මෙම නිලධාරියා උතුරු මැද පළාත් සභාවට මුදාහැරීම පිළිබඳ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂකගෙන් ලබාගත් අනුමැතියක් නොවුණි. | උතුරු මැද පළාත් ආණ්ඩුකාරවරයාගේ ඉල්ලීම මත මුදාහැරිය බවත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඊට අදාලව විධිමත් අනුමැතියන් ඉල්ලා ඇති බව. | විධිමත් අනුමැතීන් මත සේවකයින් මුදාහැරිය යුතු වීම. |
| (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ට අදාලව 2020 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1973 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 1825 ක් විය. අනුමත කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 148 න් පුරප්පාඩු 80 ක් ම ග්‍රාම නිලධාරී තනතුරට අදාල වූ අතර සංවර්ධන නිලධාරි හා කාර්මික නිලධාරි තනතුරු 7 බැගින් විය. පවතින ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව වන 572 සැලකීමේදී පුරප්පාඩු සංඛ්‍යාව සියයට 14 ක ප්‍රමාණයක් විය. | තනතුරකට බඳවා ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්ට බලය නොමැති බැවින් පුරප්පාඩු ඇති වූ වහාම අදාල බලධාරීන් දැනුවත් කරන බව. | අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු බව |